# මොණරාගල දිස්ත්‍රික්කය



ඩී. ඇස්. හපුතන්තිරි ලියයි

ඡේයා රූ: ශාන්ත වීරසිංහ

මුළු මහත් ජාතියම වගා සටනක පෙරමුණ ගනිද්දී ගොවිතැන් ව්‍යාප්ති කටයුතු සොයා මෙවර අප ගියේ මොණරාගල දිස්ත්‍රික්කය ටයි. මේ දිස්ත්‍රික්කයේ මෙතෙක් කල් පැවති ගතානුගතික හේන් ගොවිතැන් ක්‍රමය වෙනුවට අළුත් ක්‍රම අනුව, අළුත් වගාවන් ඇරඹීමට ගොවි මහතුන් සැරසෙන අවස්ථාවකයි අප ගියේ.

මෙහිදී මුලින්ම අප ගියේ මොණරාගල දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථානයට. දිස්ත්‍රික්කයේ නොයෙක් පෙදෙස්වල සිට තමන්ගේ අතින්ම වියදම් කර එහි පැමිණි ගොවි මහතුන් පිරිසක් අපට එහිදී මුණ ගැසුනා. දිස්ත්‍රික්කයට සුදුසු වී වර්ග, බඩ ඉරිඟු, ඉදල් ඉරිඟු, උක්, එලවලු වර්ග, එළු ආදී බෝග වර්ග පිළිබඳ ප්‍රායෝගික හා දේශනික වගයෙන් ලැබෙන පුහුණුව ඉතාමත් ප්‍රයෝජනවත් බව ඒ ගොවි මහතුන්ගෙන්ම අපට අසන්න ලැබුනා. මෙම පුහුණුවේ ප්‍රතිඵලයක් වශයෙන් දිස්ත්‍රික්කයට නුහුරු බෝග වර්ග රාශියක්ම වගා කිරීම කෙරෙහි ගොවි ජනතාවගේ සැලකිල්ල යොමුවෙලා තිබෙන බව දිස්ත්‍රික්කයේ නොයෙකුත් තැන්වල ගොවිතැන් කටයුතු බලන්න ගිය අපට පැහැදිලි වුනා.

1968 දී මුලින්ම අක්. 5 කින් අරඹා අද අක්. 150 ක් දක්වා සාර්ථකලෙස උක් වගාව කරගෙන යන කුඹුක්දණ්ඩහි ඒ. ඇම්. කේ. ගුණවර්ධන මහතා ඊට හොඳ නිදසුනක්. නොයෙකුත් වගාවන් සාර්ථක ලෙස කරගෙන යන මෙවැනි ගොවිමහතුන් කීප දෙනෙකු ළඟටම මොණරාගල දිස්ත්‍රික්ක කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි මිල්ටන් බටගොඩ මහතා හා කොට්ඨාශ භාර කෘෂිකර්ම උපදේශක මහතුන් අපව කැඳවාගෙන ගියා.

වර්ග ප්‍රමාණය අනුව විශාලම දිස්ත්‍රික්කයයි මේ. එසේ වුවත් ජනගහණය දෙලක්ෂය කට පමණ සීමාවෙලයි තියෙන්නේ. අක්. 25,000ක් පමණ වූ බිම් ප්‍රමාණයක වී ගොවිතැන් කරන අතර, මේ දිස්ත්‍රික්කයට මුල් තැනක් හිමිවන බෝග වර්ග කීපයක්ම වගා

කරනවා. බඩ ඉරිඟු, ඉදල් ඉරිඟු, උක්, කජු, රටකජු හා මිරිස් වලට මෙහිදී මුල් තැනක් ලැබිල තියෙනවා. සුළු අපනයන බෝග හැටියට කොකෝවා වැඩි වශයෙනුත් ගම්මිරිස්, කෝපි හා කජු සුළු වශයෙනුත් වගා කරනවා.

මොණරාගල දි. කෘ. ව්‍යා. නි. බටගොඩ මහතා දිස්ත්‍රික්කය තුළ අප සමඟ සංචාරය කරමින් දිස්ත්‍රික්කයේ ගොවිතැන් ප්‍රගතිය ගැන දීර්ඝ විස්තරයක් අපට කළා. වී, ඉදල් ඉරිඟු, බඩ ඉරිඟු, රටකජු, මිරිස්, මුංඇට, තෝර පරිප්පු, සෝයා බෝංචි, උක්, කජු වැනි වගාවන් නැංවීමට දිරියක් රජයෙන් දරාගෙන යනවා. මොණරාගල දිස්ත්‍රික්ක දේශපාලන අධිකාරී රාජ්‍ය සභා නියෝජිත රාජා වෙලේගම මහතාත්, දිසාපතිතුමා ඇතුළු අනිකුත් රජයේ නිලධාරීනුත් ප්‍රදේශයේ ගොවි ජනතාවගේ යහපත පිණිස දිවා රෑ වෙහෙස දරණ බව බටගොඩ මහතා අපට පැවසුවා.

දිස්ත්‍රික්කයේ අක්. 25,000ක වී ගොවිතැන් කෙරෙන අතර, මහා වාරිමාර්ග වලින් අක්. 8,000 කුත් සුළු වාරිමාර්ග වලින් අක්කර 7,000 කුත් ඉතිරි කොටස වැසි ජලයෙනුත් වගා කරනවා. පසුගිය අවුරුද්දේ දෙසැම්බර් දක්වා වූ වාර්තා අනුව සියයට හැටක පමණ දියුණු වී වර්ග වගා කරන බව අපට පැහැදිළි වුනා. ඒ අන්දමින් බීජී 11—11, බීජී 34—8 බීජී 34—6, අයි. ආර්. 8, එච් 4, එච්. 8, එච්. 7 යන වර්ග වැඩි වශයෙන් වගා කරල තිබුනා. මේ හැම කුඹුරක්ම පාහේ ක්‍රමානුකූලව පෝර දාල, වල් මර්දනය කරල වගා කරනව. 1969-70 ඉදල සියයට හැටක් පමණ පැල සිටුවීම කරනව. රසායනික පෝර යෙදීම පිළිබඳ හැම ඉලක්කයක්ම ඉක්මවා ගොස් තිබුන බව අපට දැන ගන්න ලැබුනා. දිස්ත්‍රික්කයේ සාමාන්‍ය අස්වැන්න අක්කරයකින් බුසල් 60 ක් පමණ කියන්න පුළුවන්. මේ අස්වැන්න ක්‍රමයෙන් වැඩිවෙමින් පවතින බව බටගොඩ මහතාගෙන් අපට දැනගන්න ලැබුනා.

බඩ ඉරිඟු මේ දිස්ත්‍රික්කයේ තවත් පැරණි ඒ වගේම වැදගත් වගාවක්. මීට පෙර අවුරුදුවලදී දිස්ත්‍රික්කයේ බඩ ඉරිඟු අක්. 15,000 ක් පමණ මාස් කන්නෙදි වගා කළත් පසුගිය මාස් කන්නෙදි අක්කර 24,100 ක් වගා කරල තිබෙන බව කෘෂිකර්ම උපදේශක (බඩ ඉරිඟු) ඇම්. බෝගහවත්ත මහත්මය අපට ප්‍රකාශ කළා. මෙම වගාවට පෙරට වඩා ඉල්ලීමක් තියෙනව වගේම ආහාරයට ගැනීමත් ක්‍රමයෙන් ජනප්‍රිය වෙලා තියෙනව. තවත් වැදගත් දෙයක් හැටියට බඩ ඉරිඟු අක්. 154කට අවශ්‍ය බීජ වගේම පෝරත් ගොවිකම් දෙපාර්තමේන්තුවෙන් සැපයීම සඳහන් කරන්නට පුළුවන්. මෙම වගාවන් කරල තියෙන්නේ ස්ථාන පහක ඇති කළ විශේෂ ව්‍යාපාරවල.

ඉදල් ඉරිඟු තවත් සීඝ්‍රයෙන් දියුණු වෙමින් පවතින අතිරේක ආහාරයක්. මේ දිස්ත්‍රික්කය තුළ මුලදී පිට පිටම වගා කරල තිබුණේ දේශීය වර්ග. 1973 යල් කන්නෙදී අයි. ඇස්. 2941 වැඩි දියුණු වර්ගය අක්කර 28 ක ආදර්ශන හැටියට වගා කළා. එය කොතරම් ජනප්‍රිය වුනාද කියතොත් 1973-74 මාස් කන්නෙදී අක්කර 680ක වගා කරල තියෙනවා. මේ වගේ ඉතාමත් සාර්ථක ලෙස බඩ ඉරිඟු හා ඉදල් ඉරිඟු වගාවන් කිපයකටම මහඹය කෘෂිකර්ම උපදේශක අයි. ජී. ප්‍රේමදාස මහතා අපව කැඳවාගෙන ගියා. මෙම වගාවන් මෑතක ඉදල ඉතා සීඝ්‍රයෙන් ජනප්‍රිය වීගෙන යනව වගේම ආහාරයට ගැනීමටත් පුරුදු වීගෙන යන බව ඒ මහත්මයාගෙන් අපට දැනගන්නට ලැබුන.

රටකජු මෑතක ඉදල වගාවට වගේම ආහාරයට ගැනීමත් ව්‍යාප්ත වීගෙන යන දිස්ත්‍රික්කයේ තවත් පාරම්පරික අතිරේක ආහාර බෝගයක්. දේශීය වැල් දුවන වර්ග වගේම දෙපාර්තමේන්තුවේ අනුමත වර්ගත් වගා කරන අතර ආහාරයට ගැනීමත් ව්‍යාප්ත වෙමින් පැවතීම විශේෂ සිද්ධියක්.

මිරිස් වගාවේ ඉලක්කයද පසුකර ඇති බව අපට දැනගන්න ලැබුන. දිස්ත්‍රික්කයේ වගා ඉලක්කය අක්. 5,000 ක් වුවත්, අක්. 6,500 ක වගා කරල තියෙනවා. නියඟෙන් හානි සිදු නොවුවොත් අක්කරයකින් හොණ්ඩර 2½-3 ක අස්වැන්නක් ගන්න පුළුවන්. මහඉලුප්පල්ලම වර්ගය වගා කිරීම ජනප්‍රිය වෙමින් පවතින අතර පෝර යෙදීම හා වල් මර්දනයටත් ගොවීන් ක්‍රමයෙන් පුරුදු වීගෙන යනවා.

මුංඇට දිස්ත්‍රික්කය තුළ ප්‍රගතියක් ලත් තවත් ආහාර බෝගයක්. පෙර සිට මුංඇට වගා කළත් 73-74 මහ කන්නයේදී අක්. 2,500ක් පමණ දෙගුණයක ප්‍රමාණයක් වගා කළ බව අපට දැනගන්න ලැබුනා. අනුමත වගා භාවිතය ක්‍රමයෙන් වැඩිවෙමින් පවතින අතර, අක්කරයකින් රාත්තල් 700-800ක අස්වැන්නක් මේ දිස්ත්‍රික්කයේ ගොවීන් ලබාගන්නාව. එය සතුටුදායක අස්වැන්නක්.

**තෝර පරිප්පු,  සෝයා බෝංචි** මුල් වරට අරඹන ලද තවත් බෝග දෙකක්. පසු ගිය අවුරුද්දේ තෝර පරිප්පු ආදර්ශණ පාත්ති වගා කළත්, වගාවක් හැටියට පටන් ගත්තේ මේ අවුරුද්දේ. දනට අක්කර 25ක් පමණ වගා කරල තියෙනවා. මේ අවුරුද්දේ පටන් ගත්ත සෝයා බෝංචි අක්කර 23ක් පමණ වගා කරල තිබෙන අතර එය ක්‍රමයෙන් ජනප්‍රිය වීගෙන යනවා.

**මයියොක්කා** වගාවේ ඉලක්කය අක්කර 12,000 ක් වුවත්, එය අක්. 15,000 දක්වා වැඩිවෙලා තියෙනවා. ඒ හැර බතල අක්කර 600 ක් පමණ වගා කරල තිබුන.

**උක්** වගාවත් අප මුලින් සඳහන් කළාවගේ ඉක්මණින් ව්‍යාප්ත වීගෙන යන බෝගයක්. මුලින්ම 1972 දී දෙපාර්තමේන්තුවෙන් ව්‍යාප්ත කටයුතු පටන් ගන්නා විට දිස්ත්‍රික්කයේ වගා කරල තිබුනේ අක්. 50 ක් පමණයි. අද එය අක්. 350 දක්වා වැඩිවෙලා තියෙනවා. මේ වගාවේ ව්‍යාප්ති කටයුතු අතර අවශ්‍ය කාර්මික උපදෙස් ලබා දීමත්, බීජ දඬු ලබාදීමත් මුල් තැනක් ගන්නවා. පසුගිය මාස් කන්නෙදි ප්‍රවාහණ ගාස්තු පමණක් අය කරල සී. ඕ. 527 වගීයේ දඬු ටොන් 125 ක් ගෙන්වල දීල තියෙනවා. සියයට 50 සහනාධාර ක්‍රමයට පෝරත්, අක්කරයකට රු. 800 බැගින් වගා ණයත් ලබාගන්න පුළුවන්. මිරිකීමේ යන්ත්‍ර සැප යීමට කටයුතු කරන අතර දනටමත් එවැනි යන්ත්‍ර 3 ක් සපයල ඇති බව දනගන්නට ලැබුනා. මොණරාගල කෘෂිකර්ම උපදේශක ජිනදාස මහතාත් වැල්ලවාය කෘෂිකර්ම උප දේශක ගුණසේකර මහතාත් මෙම ව්‍යාපාර වල යෙදී විශේෂ උනන්දුවකින් කටයුතු කරනවා.

**පළතුරු** හැටියට දෙහි හා දෙළුම් වතු කීප යක්ම බලන්න යාමට අපටත් අවස්ථාව ලැබුණා. ඒ අතර ආදර්ශමත් ගොවියෙක් හැටි යට දනට වලවේ සංවර්ධන ව්‍යාපාරයේ සේවය කරන්නෙකු වන යූ. ඩී. චන්ද්‍රසේන මහතා හඳුන්වන්න පුළුවන්. මබුල්ල ගොවිකම් උප දේශක වර්ණපාල විමලරත්න මහතා මෙම දෙළුම් වගාවට අපත් සමග යන අතර, පෙදෙසේ දෙළුම් වගාවේ ඉතිහාසය ගැන දීර්ඝ විස්තරයක් කළා. හොඳින් වගාකල දෙළුම් අක්කරයකින් කෙනෙකුට ජීවත් විය හැකි බව, එවැනි ආදර්ශමත් ගොවීන් කීප දෙනෙකු වෙත අප කැඳවාගෙන ගොස් ඔවුන්ගේ ආදායම් තත්ත්වයද පෙන්වා දුන් ඔහු අපට ඔප්පු කළා. දිස්ත්‍රික්කයේ දෙළුම් වගාකර ඇති මුළු අක්කර ප්‍රමාණය සෙවීම පිණිස ගොවිකම් දෙපාර්තමේන්තුව විසින් සමීක්ෂණයක් අරඹා ඇති බව දි. කෘ. ව්‍යා. නි. බටගොඩ මහතා ප්‍රකාශ කළා.

**කෙසෙල්** වගාව අක්කර 2,000 ක පමණ කෙරෙනවා. වැඩියෙන් වගා කරන්නේ කෝලි කුට්ටු හා අළු කෙසෙල් යන වගී. මිදි අක්කර 30 ක් පමණත් වැල් දෙළුම් අක්කර 16 ක් පමණත් වගා කරල තිබෙන අතර, මේවාත් මෑතක ඉඳල ජනප්‍රිය වීගෙන යන වගාවන්. වාරිමාගී යටතේ **අන්නාසි** වගාවෙන් හොඳ ප්‍රතිඵල ගන්න පුළුවන් බව දිස්ත්‍රික්කයේ සාර්ථක ලෙස පවත්වාගෙනයන පුද්ගලික ගොවිපල් කීපයක් විසින් ඔප්පු කරල තියෙනවා.

**කපු** වගාව දිස්ත්‍රික්කයේ සාර්ථක ලෙස කෙරෙන තවත් වැදගත් මුදල් බෝගයක්. දිස්ත්‍රික්කයේ අක්. 2,000 ක පමණ මෙම වගාව කරන අතර, වැඩි වශයෙන් කෙරෙන්නේ තණමල්විල, හම්බේගමුව, කල වැල්ලගම, බෝදගම, රංදෙනිය, වැල්ලවාය, බුත්තල, හොරබොක්ක හා පොතු ලියද්ද යන පෙදෙස් වල. එම පෙදෙස්වල මේ වගාව ජනප්‍රිය වීමට හේතු කීපයක් තිබෙනව. එම පෙදෙස්වල පවතින වියළි පරිසරයට ඔරොත්තු දීමත් නිසරු බිම් වල වගා කළ හැකි වීමත් නිසා මෙය පෙදෙසට සුදුසු බෝගයක්.

වගාවේ දියුණුවට රජයෙන් කෙරෙන ආධාර කීපයක් තියෙනව. අක්කරයකට අවශ්‍ය බීජ දෙපාර්තමේන්තුවෙන් නොමිලේ ලබාදෙනව. වගාවට අවශ්‍ය ණය මුදල් රජයෙන් ලබා

ගන්න පුළුවන්. ඒ අතර ඔවුන්ගේ නිෂ්පාදනය සහතික මිල යෝජනා ක්‍රමය යටතේ පළාතේ සමූපකාර සමිතිවලට අලෙවි කර ගන්න පුළුවන්. මේ වගාව කෙරෙන්නේ හේන්වල වැසි ජල වගාවක් හැටියට. සාමාන්‍යයෙන් එක් ගොවියෙක් අක්. 5 ක් පමණ වගා කරනව. මේ අන්දමට සාර්ථක ලෙස කපු වගා කළ හේන් කීපයකටම දි. කෘ. ව්‍යා. නි. බටගොඩ මහතා අප කැඳවාගෙන ගියා.

දිස්ත්‍රික්කයේ පිහිටි විශේෂ ව්‍යාපාර කීපයක් නැරඹීමටත් අපට අවස්ථාව ලැබුනා. **තණමල්විල පිහිටි සර්වෝදය ගොවිපලටයි** අප මුලින්ම ගියේ. ලස්සන පරිසරයක පිහිටි එම ගොවිපලට යන විට සර්වෝදය තරුණ-තරුණියන් ඉතාමත් කඩිසර ලීලාවකින් ගොවිපලේ නොයෙක් අංශවල වැඩපල කරමින් සිටි හැටි දකින්න ලැබුන. අප රටේ ගම්බද තරුණ තරුණියන්ට ගොවිතැන ගැන විද්‍යාත්මක පුහුණුවක් ලබාදෙන අතර, මෙරට අතරින් ස්වයංපෝෂිත කිරීමෙහිලා මෙම ගොවිපලෙන් ඉටුවන්නේ මහගු සේවයකි.

**දෙබරආර විශේෂ ව්‍යාපාරය** තවත් සාර්ථක ව්‍යාපාරයක්. පුද්ගලික අංශයත්, රාජ්‍ය අංශයත්, එක්වී පැරණි වැවක් සංවර්ධනය කිරීමයි මෙහි මූලික අරමුණ. මෙහිදී අපට හමුවූ ව්‍යාපාරයේ අධිකාරී ජී. ගුණසේකර මහතා එහි පරමාර්ථ තවදුරටත් විස්තර කළා.

**"පුද්ගලික අංශයත් රාජ්‍ය අංශයත් එක්වී කටයුතු කර ආදායම රජයට ලබා දීමයි මෙහි මූලික අරමුණ. මේ යටතේ තෝරාගත් ගොවීන් 60 දෙනෙකුට එක් අයෙකුට කුඹුරු අක්කර 3 ක් හා අතිරේක බෝග අක්කරයක් බැගින් වගා කිරීමට දීල තිබෙනවා. මෙසේ තෝරාගෙන ඇත්තේ පිට පළාත්වල ගොවීන්. 1973 අගෝස්තු වන විට වැවේ බැම්ම අවසන් කළත් වානේ වැඩ අවසන් නොවූ නිසා වැසි ජල බලාපොරොත්තුවෙන් බීජී 34-8 වගාකළ අතර, අක්කරයකින් බුසල් 50 ක අස්වැන්නක් ලැබුනා. මෙයින් බුසල් 6,000 ක් ගොවිකම් දෙපාර්තමේන්තුවට දීමට බලාපොරොත්තු වනවා. මෙයින් ලැබෙන ආදායමෙන් රුපියල් 235 ක් පමණ අක්කරයක වගාවට දී ඉතිරි මුදල ඔවුන් අතර බෙදා දීමට අදහස් කරනව. මේ හැරුණුවිට උස්සාන වාරිමාර්ග හා වෙනත් කොටස්වල අතිරේක ආහාර බෝග වගා කිරීමටයි අදහස.**





ඉහළ : 73/74 මාස් කන්නයේදී, මොණරාගල දිස්ත්‍රික්කයේ බඩ ඉරිඟු අක්. 24,100 ක පමණ වගා කෙරී ඇත.

පහළ : 73/74 මාස් කන්නයේදී, ඊට කලින් කන්නයේදී මෙන් දෙගුණයක ප්‍රමාණයක් මුංඇට වගා කෙරී ඇත.

**මෙය අළුතින් ඇරඹුනේ පැරණි සම්ප්‍රදාය අනුව. වැව ගම, කුඹුරු යාය ආදී වශයෙන් වෙන් කර වගා කිරීමෙන් අක්කරයකින් රු. 400 ක් ලබාගැනීමට බලාපොරොත්තු වෙනවා. ”**

දෙබරආර ව්‍යාපාරය අරඹා ගතවූ කෙටි කළ තුළදී ගොවීන් සෑහෙන ආදායමක් ලබා ඇති අතර ඔවුන් ඉතාමත් සතුටින් හා උනන්දුවෙන් වැඩ කළ බැව් ගුණසේකර මහතා සමග ඔවුන් කීපදෙනෙක් හමුවූ අපට පෙනීගියා.

**තරුණ ගොවි සමාජ ව්‍යාපාරයද** දිස්ත්‍රික්කය තුළ නව ප්‍රතිසංවිධානයක් යටතේ ක්‍රියාත්මක කර ගෙන යන බැව් දැනගන්නට ලැබුණා. දිස්ත්‍රික්කයේ සෑම කෘෂිකර්ම ව්‍යාප්ති සේවක කොටසකම ආදර්ශ තරුණ ගොවි සමාජය බැගින් පවත්වාගෙන යාමට කටයුතු යොදා ගෙන යනවා. මැදගම කෘෂිකර්ම උප දේශිකා ස්වර්ණා අතපත්තු මහත්මිය අප එවැනි ආදර්ශමත් තරුණ ගොවි සමාජයකට එක්කරගෙන ගියා. 1962 දී අරඹන ලද මැදගම **විජය** තරුණ ගොවි සමාජය දැනට අක්කර 5 ක පමණ රටකජු අක්. 5 ක වීත් හැරුණුවිට මිරිස්, බඩ ඉරිඟු හා එලවලු වගීත් වගා කරල තිබුන.

මොණරාගල පැරණී වැව්, සිද්ධස්ථාන ආදියෙන් හෙබි අලංකාර පරිසරයකින් යුත් දිස්ත්‍රික්කයක්. මේ දිස්ත්‍රික්කයේ ගොවීන් අතර ඉතාමත් වැදගත් සංස්කෘතික ලක්ෂණ හා ගොවි සිරිත් විරිත් රාශියක් දකින්න පුළුවන්. අපට එහිදී හමුවූ මොණරාගල සහකාර දිසාපති නිමල් සමරසුන්දර මහතා එම දිස්ත්‍රික්කයේ ගොවීන් නොකඩවා පවත්වනු ලබන ගොවි උත්සව කීපයක් ගැනම විස්තර කළා.

සෑහෙන කාලයක් තිස්සේ හේන් ගොවිතැන වැනි ගතානුගතික ගොවිතැන් වලට හුරු පුරුදු වී සිටි ගොවීන් දැන් ක්‍රමයෙන් නව විද්‍යාත්මක ගොවිතැන කෙරෙහි සිත් සතන් යොමුකර ඇති බව ඒ දිස්ත්‍රික්කයේ දින කීපයක් ගතකළ අපට පැහැදිලි වුනා. ඒ වුවත් ඔවුන්ගේ වැදගත් සිරිත් විරිත් හෝ ගතිගුණ වලට ඉන් හානියක් වී නෑ. දිස්ත්‍රික්කයේ සෑම රජයේ නිලධාරියෙක්ම පාහේ ඔවුන්ගේ දියුණුවට අත හිත දීමට නිතර වෙහෙසෙන බව අපට දකින්න ලැබුණා. ඒ හැම දෙනෙගෙන් නැවත ආපසු ඒමට අප සමුගත්තේ ගොවිතැන දියුණුව කෙරෙහි වේගයෙන් ඉදිරියට ගමන් ගන්නා දිස්ත්‍රික්කයක් පිළිබඳ කරුණු රාශියක් සිත්හී දරා ගෙනයි.





ඉහළ: කෘ. උ. (බඩ ඉරිඟු) ඇ.ඩී. බෝගහවත්ත බඩ ඉරිඟු වගාව ගැන ගොවීන්ට කියා දෙයි.

පහළ: යූ. ඩී. බන්දුලසේන මහතා ඇතුළු පවුලේ අය තම දෙඩම් වගාවේ ඵල නෙලද්දී.